සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S I

# ක්‍රිස්තියානි ධර්මය - I

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ලෝකය අලුත් කිරීමේ වගකීමේ පණිවිඩය ලබාදෙන චරිතය වන්නේ,
   (i) හෙරෝද් රජුය (ii) ආහබ් රජුය (iii) නෝවාය (iv) ආබ්‍රහම් ය
2. ''ඔබ වඩා දැහැමි'' යයි ප්‍රකාශ කරමින් දාවිත්ගේ දැහැමි බව පිළිගත්තේ
   (i) ජොනතන්ය (ii) සාවුල් රජුය (iii) සාමුවෙල්ය (iv) ජේස්සේය
3. ස්වාමින්ගේ යාච්ඤාවේ ප්‍රධාන ලක්ෂණය වන්නේ,
   (i) සාමුහිකත්වයයි (ii) අර්ථ ශුන්‍ය බවය (iii) ආයාචනයයි (iv) ආත්මාර්ථයයි
4. කානාහි විවාහ මංගල්‍යයේ දී ජේසුස් වහන්සේගේ අණට කීකරු වූ සේවකයන් අත් දුටුවේ,
   (i) කටුක අත්දැකීමකි (ii) ධන ලාභයකි (iii) අමිහිරි අත්දැකීමකි (iv) ප්‍රාතිහාරයකි
5. ජේසුතුමා විසින් මනුෂ්‍යයාගේ ශාරීරික අවශ්‍යතා කෙරෙහි සංවේදී වූ අවස්ථාවක් වන්නේ
   (i) මන්නා ලබා දීමේදීය (ii) මුහුද මත ඇවිදීමේදීය
   (iii) හාර දහසකට ආහාර දීමේදී ය (iv) එළියාට ආහාර ලබා දීමේදී ය
6. තම පුත්‍රයාගේ සුවය පතා ජේසුස් වහන්සේ හමුවීමට කපර්ණවුමට පැමිණියේ
   (i) මග්දලායේ මරියාය (ii) පේදුරු තුමාය (iii) මතෙව් ය (iv) රාජ්‍ය නිලධාරියාය
7. ජේසුස් වහන්සේ ධර්ම ශාලාවේදී සුවපත් කරන ලද්දේ
   (i) ලාදුරු රෝගීන් දසදෙනෙකි (ii) අන්ධ පුද්ගලයෙකි
   (iii) අත පණ නැති මිනිසාය (iv) මී මැස්මොර රෝගියෙකි
8. .................................... සුවය පතා රෝගීන් මත වැටුණු විට සුවය අත්විය.
   (i) පේදුරු තුමාගේ (ii) ජොහාන් තුමාගේ
   (iii) මතෙව් තුමාගේ (iv) යෙසායා දිවැසිවරයාගේ
9. තබීතා නම් කාන්තාවට සුවය ලැබුණේ
   (i) ජෙරුසලමේදී ය (ii) ජොප්පාවේදී ය (iii) රෝමයේදී ය (iv) කොරින්තියේදී ය
10. ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරමින් සතුරාට සමාව දීමේ ගුණාංගය තම ජීවිතාදර්ශයෙන් පෙන්වා දුන්නේ,
    (i) පාවුළු තුමාය (ii) මෝසෙස් ය (iii) ස්තේපන් තුමාය (iv) පිලිප් තුමාය
11. හිතෝපදේශයට අනුව වංචාවෙන් පොහොසත් වන මිනිසාගේ වස්තුව මී දුමක් සේ
    (i) වර්ධනය වේ (ii) විනාශ වේ (iii) පැතිර යයි (iv) පහව යයි
12. මුල් කිතුනු සභාවේ කිතුනුවන් අත්අඩංගුවට ගැනීමට නායකත්වය ලබාදුන්නේ,
    (i) බාර්ණබස්ය (ii) සාවුල්ය (iii) මතෙවිය (iv) ස්තේපන්ය
13. ''මාගේ පුත්‍රය විචක්ෂණ බුද්ධිය ද, තීක්ෂණ ඥාණය ද දියුණු කරගන්න.'' මෙම උපදෙස් අඩංගු ග්‍රන්ථය වන්නේ,
    (i) උත්පත්ති පොත ය (ii) හිතෝප දේශයයි (iii) ප්‍රඥා සාහිත්‍යයි (iv) ගීතාවලියයි
14. දේව වචනයට අනුව අප ''ශුද්ධාත්මයාණන් වහන්සේගේ ............................................''
    (i) මාලිගය වේ (ii) පර්වතය වේ (iii) අනුහස වේ (iv) පවුර වේ
15. අපගේ ජීවිත අඳුර මැදින් ගමන් කරන බියකර අවස්ථා වලදී අපට පිහිට වන්නේ,
    (i) ආලෝකයයි (ii) මිතුරන් ය (iii) දෙවි පියාණන් ය (iv) කාය ශක්තියයි
16. ලෞකික දේ වලට අනවශ්‍ය ලෙස ප්‍රමුඛතාව හිමිකර දීම නිසා දේව සබඳතාව
    (i) දුර්වල වේ (ii) වර්ධනය වේ (iii) සංවර්ධනය වේ (iv) පෝෂණය වේ
17. කොරින්ති සංදේශයට අනුව අප සියල්ල කළ යුත්තේ.
    (i) ලාභ අපේක්ෂාවෙනි (ii) විනෝදය සඳහා ය
    (iii) දේව ගෞරවය උදෙසාය (iv) රටේ සංවර්ධනය උදෙසාය

18. යහපතට ඇලුම් ව නපුර පරාජය කිරිමට කළ යුත්තේ,
(i) උසස් යැයි සම්මත දෙය කිරීමය (ii) අසම්මත දෙය කිරීමය
(iii) නපුරට එරෙහිව අවි ගැනීමය (iv) යක්ෂයා පරාජය කිරීමය

19. දෙවියන් වහන්සේ අප උන්වහන්සේගේ දරුවෙකු ලෙස පිළිගැනීම තුළ අපට හිමි වන සහතිකය වන්නේ,
(i) අනුකම්පාවයි (ii) දමිටු කමය (iii) ජීරත්වයයි (iv) නිහතමානී බවයි

20. රෝම සංදේශයට අනුව අප සේවය කළ යුත්තේ
(i) සූදානම් ශරීරයෙන් ය (ii) අලසකමින් ය (iii) උද්යෝගිමත් හදවතකිනි (iv) නිරහාරවය

## II කොටස

පළමු ප්‍රශ්නයටත්, තෝරාගන්නා ලද ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

1. (i) දාවිත් රජු සතුරාට සමාව දුන් අවස්ථා 2 ක් ලියන්න
(ii) යාච්ඤාවක් සිදු කිරීමේදී අප අනුගමනය කළ යුතු ක්‍රියාවන් 2 ක් ලියන්න
(iii) දින තුනක් පුරාවට ජේසුස් වහන්සේ සමග රැඳී සිටි ජනතාව ගැන එතුමා දක්වූ ප්‍රතිචාර 2 ක් ලියන්න
(iv) අත පණ නැති මිනිසා සුව කිරීමේදී ජේසුතුමා දක්වූ ප්‍රතිචාරයෙන් දෙකක් ලියන්න
(v) ශුද්ධාත්ම දානයෙන් පසු ප්‍රේරිතයන් විසින් කරන ලද පළමු ප්‍රාතිහාර්ය කුමක්ද? එය සිදුවූයේ කොහේදී ද?
(vi) නවීන තාක්ෂණික දියුණුව නිසා මිනිස් ජීවිත කෙරෙහි බලපාන ලද අහිසි ප්‍රතිවිපාක 2 ක් ලියන්න
(vii) කොලොස්සි සංදේශයට අනුව අප විසින් නසා දැමිය යුතු දුසිරිත් 2 ක් ලියන්න
(viii) ඉශ්‍රායෙල්වරු සාමුහිකව එක්ව පීඩාකාරී අවස්ථාවන්හි දෙවියන් වහන්සේගේ පිහිට පැතු අවස්ථා 2 ක් ලියන්න
(ix) පාවුල් තුමා විසින් රෝමවරුනට යවන ලද ලිපියට අනුව කිතුනු ප්‍රතිපත්ති වර්ග කළ හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න
(x) මතෙව් තුමාගේ සුභාරංචියට අනුව ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වීමට සපුරාලිය යුතු අවශ්‍යතා දෙක කුමක්ද? (ලකුණු 2x10 =20)

2. (i) දැහැමි පුද්ගලයෙකු වූ නෝවාගේ චරිතයෙන් ඔබට ලැබෙන ආදර්ශ 2 ක් ලියන්න
(ii) කිතුනු දරුවෙකු වශයෙන් ඔබ සමග සිටින්නන් සමග ප්‍රේමයෙන් ක්‍රියා කළ අවස්ථා 3 ක් ලියන්න
(iii) දාවිත් රජුගේ චරිතයෙන් ඔබගේ ජීවිතයට ලැබෙන මගපෙන්වීම් 5 ක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

3. (i) ශුද්ධාත්ම දානය තුළින් සවිමත් වූ ප්‍රේරිතයන් සිදුකළ ක්‍රියා 2 ක් ලියන්න. (ලකුණු 2+3+5)
(ii) සමාජයේ විවිධ අවශ්‍යතා ඇති අය කෙරෙහි අවධානය යොමු කිරීමේදී අප සැළකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න.
(iii) පේදුරු හා ජොහාන් තුමා මන්ත්‍රණ ශාලාවේදී කළ දේශනාව තුළින් කිතුනු දිවියට ලැබෙන ආදර්ශ 5 ක් ලියන්න (ලකුණු 2+3+5)

4. (i) මුල් කිතුනු සභාව උපස්ථායකයින් පත් කිරීමට හේතුව කුමක්ද ? ඒ කුමන කාර්යයක් සඳහා ද?
(ii) ශුද්ධාත්මයාණන් තුළින් දිරිය ලැබූ පාවුළු තුමා කළ කාර්යයන් 3 ක් ලියන්න
(iii) ශුද්ධාත්මයාණන් වහන්සේ කරණකොට ගෙන ඔබගේ ජීවිතයට සහනය හා සැනසුම ලද අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 2+3+5)

5. (i) දේව රාජ්‍යයේ මෙහෙවර උදෙසා තරුණ වියේදී ඔබගේ ශක්ති ප්‍රමාණයෙන් කැප කළ යුත්තේ මොනවාද?
(ii) අයහපත් හැසිරීම් රටාව නිසා පවුලක් මුහුණදෙන ගැටළු 3 ක් ලියන්න.
(iii) දෙවියන් වහන්සේට ප්‍රසන්න දිවියක් ගත කිරීම සඳහා ඔබ අනුගමනය කරන ගුණාංග 5 ක් ලියන්න. (ලකුණු 2+3+5)

6. (i) ව්‍යසනයන්ට මුහුණ දුන් අය ඒ සඳහා දක්වන ප්‍රතිචාර 2 ක් ලියන්න.
(ii) ගීතාවලියට අනුව ඉශ්‍රායෙල් ජනතාව පීඩාකාරී අවස්ථාවන් හිදී ඔවුන් සමග වැඩවසන දෙවියන් වහන්සේ ගැන සිදුකළ ප්‍රකාශයන් 3 ක් ලියන්න
(iii) දෙවි පියාණන්ගේ සරණ හා ශක්තිය අන් අය සමග බෙදාගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 5 ක් ලියන්න. (ලකුණු 2+3+5)

7. (i) අද සමාජයේ නපුරේ බලවේග විවිධ ස්වරූපයෙන් ඔබ වෙත පෙළඹවීම් සිදුකරයි. එවැනි අවස්ථා 2 ක් ලියන්න.
(ii) පාවුල් තුමාට අනුව නපුරට එරෙහිව ක්‍රියා කරන කිතුනුවකු පැළඳිය යුතු ආයුධ 3 ක් ලියන්න.
(iii) රෝම 12:9 - 21 ට අනුව කිතුනුවකු වශයෙන් තම සහෝදරයන් කෙරෙහි පවත්වාගත යුතු ප්‍රතිපත්ති 5 ක් ලියන්න. (ලකුණු 2+3+5)

# තෙවන වාර පරීක්ෂණය - 2019

## ක්‍රිස්තියානි ධර්මය

09 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | (iii) | 2. | (ii) | 3. | (i) | 4. | (iv) | 5. | (iii) |
| 6. | (iv) | 7. | (iii) | 8. | (i) | 9. | (ii) | 10. | (iii) |
| 11. | (iii) | 12. | (ii) | 13. | (ii) | 14. | (i) | 15. | (iii) |
| 16. | (i) | 17. | (iii) | 18. | (i) | 19. | (ii) | 20. | (iii) |

II කොටස

1. (i) එන්ගෙදියේ දී සාවුල්ගේ ජීවිතය මිදීම, මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.
   (ii) හැකි සෑම විටම නිශ්චල ස්ථානයක් තෝරාගැනීම, දෑත් එක්ව තබා ගනිමින් යැදීමට හුරු වීම, දණ නමමින් යාච්ඤාවේ යෙදීම, ඇස් පියා ගැනීමට පුරුදු වීම
   (iii) කණගාටු වූ සේක, ඔවුන්ගේ ශාරීරික අවශ්‍යතා වටහා ගත්සේක. දයානුකම්පාවෙන් එම ගැටළු වලට මැදිහත්වීම.
   (iv) ඉදිරියට පැමිණීමට ආරාධනා කිරීම, සෙනගගෙන් ප්‍රශ්න කිරීම, සෙනගගේ සිත් දැඩිකම ගැන දුක් වීම, නොපමාව ඔහු සුව කිරීම
   (v) කොරෙකු සුවපත් කිරීම, සුදර්ශන නම් ලත් දොරටුව අසලදී
   (vi) පවුල් සංස්ථා බිඳ වැටීම්, අනිසි ක්‍රියා නිසා සිත් බිඳ වැටීම්, අවිශ්වාසය, අසත්‍ය තොරතුරු ගලායාම, සමාජයට අහිතකර ක්‍රියා වලට යොමු වීම
   (vii) කාම මිත්‍යාචාරයට, අපිරිසිදුකම, කාමරාග, නපුරු තෘෂ්ණා හා දුසිරිත්
   (viii) මිසරයේ වහල් සේවයේ යෙදී සිටි අවස්ථාවේදී හා බැබිලෝනීය විප්‍රවාසයේදී
   (ix) යහපත් දේව සබඳතාවයක් වෙනුවෙන් පිළිපැදිය යුතු ප්‍රතිපත්ති හා අන් අය වෙනුවෙන් පවත්වාගත යුතු ප්‍රතිපත්ති
   (x) තමකම නැසීම, කුරුසිය දැරීම හා උන්වහන්සේ පසුපස යෑම
2. (i) සත්ගුණවත් බව, නිදොස් කෙනෙකු වීම, දෙවියන් වහන්සේ සමග සුහදව හැසිරීම, දෙවි පියාණන් හමුවේ කරුණාව ලැබෙන සේ ක්‍රියා කිරීම
   (ii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න
   (iii) සාවුල් ඔහුට විරුද්ධ වූවද දාවිත් රජු සාවුල්ට ගරු කිරීම, දේව භය ඇතිව ක්‍රියා කිරීම, සටහන් පහත් වීඹ, පළිගැනීම වෙනුවට ප්‍රේමයෙන් ක්‍රියා කිරීම, දැහැමි දිවියක් ගත කිරීම, නිවැරදි දේ කෙරෙහි සිත යොමු කිරීම ආදී වශයෙන් පිටු අංක 7 ට අනුව පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න.
3. (i) ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම, විවිධ තර්ජන, නින්දා අපහාස හා ශාරීරික වේදනා භාග්‍යයක්'කොට සැලකීම
   මනුෂ්‍ය කාරණා වලට නොව දෙවියන් වහන්සේගේ කාරණා වලට මුල් තැන දීම
   (ii) සමාජයෙන් ලැබෙන අයහපත් ප්‍රතිචාර වලට පසුබට නොවීම
   ජේසුස් වහන්සේ තුළ විශ්වාසය ඇදහිල්ල හා කීකරුකම වර්ධනය කර ගැනීම, ජේසුස් වහන්සේ දිව්‍ය වෛද්‍යවරයා බව විශ්වාස කිරීම හා සමාජයට හඳුන්වා දීම
   (iii) අපගේ ගැලවුම්කරුවාණන් ජේසුස් වහන්සේ බව විශ්වාස කිරීම/ ලෞකික ජීවිතයේ කිසිදු වටිනාකමක් නැති වුවන්ට වුවද ජේසුස් වහන්සේ තුළ මහත් වටිනාකමක් ලැබෙන බව/ සියලු කාරණා වලදී දෙවියන් වහන්සේට මුල්තැන දීම/ දෙවියන් වහන්සේගේ නාමය නිසා ප්‍රතික්ෂේප වන්නන් උසස් වන බව/ ජේසුස් වහන්සේගේ අනුහසින් රෝගීන් සුවපත් වන බව විශ්වාස කිරීම
4. (i) කිතුනු සභාවේ සීඝ්‍ර වර්ධනයත් සමග ගෝලයන් කාර්යබහුල වීම නිසා/ සහනාධාර බෙදාදීම වැනි සුබසාධන කටයුතු
   (ii) හදවතින් ජේසුස් වහන්සේ පිළිගැනීම/ දෙවියන් වහන්සේ තුළ එඩිතර වීම/ විශ්වාසයෙන් දෙවියන් වහන්සේ තුළ සාක්ෂි දැරීම/ අන්‍යන්ගේ ඇදහිල්ල ශක්තියක් කිරීම
   (iii) සිසුන් ලියා ඇති අත්දැකීම අනුව ලකුණු ලබාදෙන්න.
5. (i) ශ්‍රමය, කාලය, ධනය, බුද්ධිය මෙහෙයවා ක්‍රියා කළ යුතුය.
   (ii) පවුල් ආරවුල් ඇතිවේ/ පවුල් සංස්ථාව බිඳවැටීම/ පවුලේ සතුට තුරන්ව යෑම/ පවුලේ පිරිහීම වේගවත් වීම/ දරුවන් අසරණ වීම, දේව විනිශ්චයට ලක් වීම
   (iii) අපගේ ශරීර දමනය කර ගැනීම/ අපගේ සිත් පිරිසිදුව තබා ගැනීම/ දේව කැමැත්ත අනුව ශුද්ධවන්ත දිවියක් ගත කිරීම/ කාමමිත්‍යාචාරයෙන් වැලකී සිටීම/ අන් අයට ආදර්ශමත් ජීවිත ගත කිරීම
6. (i) කම්පනයට හා භීතියට පත් වේ./ ආධ්‍යාත්මික ජීවිතයට බිඳ වැටීම/ අනාගත බලාපොරොත්තු සුන් වීම/ අන් අයගේ පිහිට පැතීම /ජීවිතය පිළිබඳ කලකිරීම
   (ii) අපගේ සරණය හා ශක්තිය වන සේක/ අප ජීවිත සුරකින සේක/අඳුර මැද අපගේ බිය දුරු කරන සේක. ජයග්‍රහණය කරා අප යොමු කරන සේක.
   (iii) එකිනෙකාගේ අයුරින් අන් අයගේ අවශ්‍යතාවයනට පිහිට වීම/ මානසික අසහනයට පත් වූවන් එම තත්වයෙන් මුදා ගැනීමට ක්‍රියා කිරීම/ අන් අයගේ ජීවිත ආරක්ෂා කිරීම/එකිනෙකාගේ බිය දුරු කිරීම/ ජීවිත ජය ගැනීමට ඔවුන් ධෛර්යමත් කිරීම/ උත්සාහයෙන් නැගී සිටීමට අත හිත දීම.
7. (i) මිතුරන් මගින් පැමිණෙන වැරදි පෙළඹවීම්/ නවීන සන්නිවේදන උපකරණ වැදි ලෙස භාවිතය/ මත්ද්‍රව්‍ය, දුම්වැටි කෙරෙහි පෙළඹවීම්/ දෙමව්පියන් හා වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදීමට මැලි වීම/ සම්මත දෙයට ගරු කිරීමට මැලි වීම
   (ii) සත්‍ය නැමති ඉගපටිය/ දැමිටුකම නැමති ළය වැස්ම/ සාම සුබ අස්න නැමති වහන්/ ඇදහිල්ල නැමති පලිහ/ ගැලවීම නැමති හිස් වැස්ම
   (iii) රෝම සංදේශයේ 12:9-21 ට අනුව ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.